## ජලාශ්‍රිත පුරාවිද්‍යාව - මූලික හැඳින්වීමක්

සරලවම පවසතොත් පුරාවිද්‍යා අධ්‍යයන ක්‍ෂේත්‍රයේම තවත් එක් අනු විෂයයක් ලෙස ජලාශ්‍රිත පුරාවිද්‍යාව සැළකිය හැක. එහෙත් එහි එකිනෙකට වෙනස් භෞතික ස්වභාවය හේතුවෙන්ම එය නෛතික විෂයයක් ලෙස වර්ධනය වීමක්ද පවති. මේ ක්‍ෂෙත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විවිධ රටවලදී මෙය හැඳින්වීම සඳහා භාවිතා කරන නාමය පිළිබඳව හැඳින්වීමක් කළයුතු වේ. ජලාශ්‍රිත, දියයට, සමුද්‍රික, නාවුක හා මුහුදු පුරාවිද්‍යා යන අරුත් සහිතව Underwater, Maritime, Nautical යන වචන මේ විෂයය හැඳින්වීමට බහුලව භාවිතා වේ. මෙහිදී වඩාත් විෂයගාමී වචනය Underwater Archaeology (ජලාශ්‍රිත හා දියයට පුරාවිද්‍යාව මෙයට වඩාත් සමගාමී සිංහල යෙදුම් වේ) වුවද වඩාත් ප්‍රචලිත හා ප්‍රායෝගික යෙදුම වන්නේ Maritime Archaeology (සමුද්‍රික/මුහුදු පුරාවිද්‍යාව) වේ.

පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟම බිඳී ගිය ජලාශ්‍රිත පුරාවිද්‍යාව (Underwater Archaeology) මුහුදෙහි පමණක් නොව ගංගා, වැව්, වගුරු බිම් ආදී සෑම තැනකම ජලයෙන් වැසුනු පුරාවිද්‍යා අවශේෂයන් හා ඒ ආශ්‍රිත කටයුතු හැඳින්වීම සඳහා භාවිතා කළ හැකි යෙදුමකි. ජලාශ්‍රිත පුරාවිද්‍යාව යනු මහජනයා අතර වඩා ප්‍රචලිතව ඇති ගිළුණු නෞකා ආශ්‍රිත කටයුතුම පමණක් නොවේ. පැරණි මානව ජන සමාජයේ පැවැත්ම හා වර්ධනය සඳහා ගෙන ගිය ක්‍රියාවලියේ දී ජලය සමඟ සහජීවනයෙන් ගත කළ සියළුම සාධක ජලාශ්‍රිත පුරාවිද්‍යාව යටතේ අධ්‍යයනය කළ හැක. එය විටක දේශාටනය හෝ වෙළඳාම සඳහා යාත්‍රා කළ නෞකාවක් විය හැක. විටක මසුන් මැරීම සඳහා භාවිතා කළ කුඩා ධීවර යාත්‍රාවක් විය හැක. එමෙන්ම ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වර්තමානයේ ජලයෙන් යට වූ ජනාවාසයක් හෝ වෙරළාශ්‍රිත කුඩා ධීවර ගම්මානයක් හෝ වරායක් විය හැක. මේ ද්‍රව්‍යමය අවශේෂ පමණක් නොව පැරණි යාත්‍රා ගොඩනැගීමේ තාක්ෂණය ද, ජලය ආශ්‍රිතව ජීවත් වූ හා ජීවත් වන ජන කොට්ඨාශයන් හි සංස්කෘතික අනන්‍යතාවයන් හා දැනුමද ජලාශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණ අංශයන් වේ. (Delgado 1994, p. 382)

පළමු ජේදයේ සඳහන් Maritime/ Mariene Archaeology හෙවත් සමුද්‍ර පුරාවිද්‍යාව නම් වූ ප්‍රචලිත යෙදුමද ජලාශ්‍රිත පුරාවිද්‍යාවට අදාල බොහෝ අංශයන් ආවරණය කරයි. එහෙත් එහි වචනාර්ථය පරිදිම සමුද්‍ර පුරාවිද්‍යාව යනු මුහුද හා සම්බන්ධ වූ පුරාවිද්‍යා අවශේෂයන්ට යොමුවීමකි. ගිළුණු යාත්‍රා මූලික කරගත් මෙම අංශය සමුද්‍ර ගමනාගමනය, වෙළඳාම, දේශාටනය හා සම්බන්ධ පුරාවිද්‍යා සාධක හා බැඳී පවතී. වෙරළාශ්‍රිත හා වරාය ආශ්‍රිත ඉදිකිරීම්, ජනාවාස හා යාත්‍රා වැනි අංශයන් කෙරේද මෙහිදී අවධානය යොමු කෙරේ. (Delgado 1994, p. 383) මේ පිළිබඳ සාකච්ඡා කිරීමේදී සමුද්‍රාශ්‍රිත සංස්කෘතීන් හා සම්බන්ධ පුරාවිද්‍යා අවශේෂ යන යෙදුම භාවිතා කරනු ලබයි.

නාවුක පුරාවිද්‍යාව (Nautical Archaeology) බොහෝ විට සාමුද්‍රික පුරාවිද්‍යාව සමගම සාකච්ඡාවට බඳුන් වුවත් විෂයයන් දෙකක් ලෙස පැහැදිලිව වෙන්කළ හැකි වූවකි. නාවුක පුරාවිද්‍යා ක්ෂේත්‍රය විටෙක සාමුද්‍රික පුරාවිද්‍යාවේ අනු විෂයක් හෝ අනු බෙදීයාමක් ලෙසද හැඳින්විය හැක. නාවුක යාත්‍රා තැනීම, භාවිතය, ශිල්ප ක්‍රම හා සම්ප්‍රදායන් පිළිබඳව ගොඩනැගී ඇති මෙම විෂය ජලජ යාත්‍රා ඉදිකිරීමේ ඉපැරණි සම්ප්‍රදායන් අඛණ්ඩව රැකගත් හා වර්ධනය කරගත් යුරෝපීය රටවල් ඇසුරේ වර්ධනය වූවකි. (Bowens 2009, p. 15)

Underwater, Maritime, Nautical Archaeology යන වදන් විවිධාකාරයෙන් විග්‍රහ කිරිම හා අවධානය කිරීමට එක් මූලික හේතුවක් වී ඇත්තේ, මේ විෂය ආශ්‍රිත සාධක හා අවශේෂ විවිධ ස්ථානයන්ගෙන් හමුවීමයි. පසුකාලීනව ගොඩවී ඇති ගංගා ඉවුරක හෝ වරායක ඇති යාත්‍රාවක් දියයට පුරාවිද්‍යාව (Underwater Archaeology) යනුවෙන් හැඳින්විය හැකිද යන්න ගැටළුවකි. වචනාර්ථය පිළිබඳව හා පරිවර්තනය පිළිබඳවද සලකා බලා වඩා උචිත යෙදුමක් ලෙස ජලාශ්‍රිත පුරාවිද්‍යාව යන වචනය භාවිතා වේ. එය දියයට යන්නට වඩා පුළුල් අර්ථයක් සහිත යෙදුමකි. එම යෙදුම ජලයෙන් යටවුණු පමණක් නොව ඒ ආශ්‍රිත අවශේෂයන් හා සංස්කෘතීන් ද අධ්‍යයනය කිරීම දක්වා භාවිතා කළ හැක්කකි. කෙසේ වෙතත් මුලින් සඳහන් කළ පරිදි මේ සෑම විෂයය ක්ෂේත්‍රයක්ම පුරාවිද්‍යාව යන මව් පදය යටතේ විග්‍රහ කළ හැක.

නැසී ගිය කිත් මුකල්රෝයි (Keith Muckelroy) මහතා පවසන පරිදි කුමන අර්ථයෙන් ගත්තද "සෑම පුරාවිද්‍යා අධ්‍යයනයකම මූලික අරමුණ වන්නේ මිනිසාය,....... ගිළුණු නෞකාවන් එහි ඇති වෙළඳ ද්‍රව්‍ය, යාත්‍රාවේ නිර්මාණය හෝ පුරාක්ෂේත්‍ර යෙදී ඔහුට මුලින්ම හමුවන අනෙකුත් ද්‍රව්‍යයන් නොවේ." ("The

primary object of the study is man……..not the ships, cargoes, fittings or instruments with which the researcher is immediately confronted” (1978, p 04)

කිසිදු සැකයකින් තොරවම, ජලාශ්‍රිත පුරාවිද්‍යාවේ ආරම්භය හා වර්ධනය වූ කලි ජලයෙහි සැඟවුණු කෞතුකවස්තූන් ගොඩනැගීම හා එක්රැස් කිරීම මූලික කරගත්තකි. වටිනා වෙළඳ ද්‍රව්‍යයන් හා භාණ්ඩ ප්‍රවාහනයෙදී ගිලීගිය යාත්‍රා සෙවීම හා එම වටිනා වස්තූන් ගොඩගැනීම මේ ක්‍රියාදාමයන්ගේ ප්‍රධාන අරමුණ විය. ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු සඳහා කරන ලද මුල්කාලීන වෑයම් අධ්‍යයනය කිරීමේදි සිදුවීම් ගණනාවක් දක්නට ලැබේ. විශේෂයෙන්ම එම උත්සාහයන් ජලය යටට යාහැකි ලෙස නිපදවන තාක්ෂණික උපාංග හා කිමිදුම් උපකරණ හා බැඳි පවති. 15 වන සියවසේදි පවා ගිලුණු නැව් වලින් කෞතුක වස්තු ගොඩගැනිම සදහා කිමිදුම් කටයුතු කල ආකාරය යුරෝපයෙන් වාර්තාවේ. ඉතාලි ගෘහනිර්මාණ ශිල්පියෙකු වු Battista Albert (1404-72) හා Francesco Demachi (1504 -76) රෝමයට නුදුරු Nemi විලේ ගිලුණු කෞතුක වස්තු ගැනීමට කරන ලද කිමිදුම් කටයුතු මේ අතර ප්‍රධාන වේ.(Bolt 1996, pg.14) කෞතුකවස්තු ගොඩගැණිම හා නිධන් සෙවීම ලෙස ක්‍රමයෙන් පැතිරුණු මෙම කටයුතු, 1950 දශකයේදී මධ්‍යධරණී ප්‍රදේශයේදී Jacques Coudtean හා George Bass වැනි අයගේ ක්‍රමානුකූල පුරාවිද්‍යා ප්‍රවේශයන් සමඟම විද්‍යානුකූල ව්‍යවහාරයන් බවට පත්විය. SCUBA (Self Contained Underwater Breathing Apparatus) වර්ගයේ කිමිදුම් උපකරණවල දියුණුවත් සමඟ ඉහත සඳහන්කළ ප්‍රවේශයන්ද සිදුවිය. පහසු භාවිතය, දියයටදී නිදහසේ අවශ්‍ය පරිදි ගමන් කිරීමට හැකිවීම හා සැහැල්ලු බව නිසා පුරාවිද්‍යාඥයින්ටද දියයටට ප්‍රවිශ්ට වීමේ හැකියාව ලැබිණ. George Bass ගේ විද්‍යානුකූල ප්‍රවේශයත් සමඟම විශාල වෙනසකට පත්වූ ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු වලින් පසු 1961 දී හා 1982 දී ආරම්භවන සුප්‍රසිද්ධ Vasa නැවේ හා Mary Rose නැවේ පුරාවිද්‍යා කටයුතු මේ ක්ෂේත්‍රයේ සංධිස්ථාන බවට පත්විය. (Green 2004, p 08)

මේ සිදුවීම් වලින් පසු ඇති වූ ප්‍රධාන සංවර්ධනය වන්නේ මෙතෙක් කල් කිමිදුම් කරුවන්ගේ හා කෞතුකවස්තු එක්රැස් කරන්නන්ගේ විධානයන් අනුව සිදු වූ කටයුතු වලට පුරාවිද්‍යාඥයින්ගේ සහභාගීත්වය වැඩිවීමයි. එමඟින් විනාශකාරී කටයුතු හා සොරාගැනීම් වෙනුවට බොහෝ ප්‍රදේශවල පුරාවිද්‍යා අවශේෂ අධ්‍යයනය කෙරේ සැලකිලිමත්භාවයක් දක්වන ලදී. වාණිජමය හා කෞතුක වටිනාකමකින් යුත රත්රන්, රිදී හෝ දුර්ලභ කලාකෘති පමණක් නොව එම පුරාස්ථානවලින් මතුකරගන්නා පුරාවිද්‍යා දත්තද එක්රැස් කිරීම සිදුවිය. කෙසේ වෙතත් නිදන් සොරුන් හා කෞතුකවස්තු එක්රැස්කරන්නන්ද මේ සිදුවීම් වලින් නොනැවතී තම කටයුතු වෙනම කරගෙන යාමට සමත් විය. එයට ප්‍රධාන හේතුව වූයේ ගොඩබිම දී මෙන් මුහුදෙන් හමුවන පුරාවිද්‍යා අවශේෂ සඳහා ප්‍රකාශිත හා ක්‍රියාත්මක වන නීතිරීතීන්ගේ තිබූ අඩුපාඩුවයි. පවතින පුරාවිද්‍යා නීති මඟින් ගිළුණු නැව් ආශ්‍රිත අවශේෂ ආවරණය නොවීය. මුහුදේ ඇති වස්තූන් ගේ අයිතිය පිළිබඳ ප්‍රචලිත කියමනක් වූයේ සොයාගන්නාට හිමිවේ හෙවත් “Founders Keepers” යන යෙදුමයි. (Devendra 2006, p 34) එහෙත් පුරාවිද්‍යාවට ලැදි පිරිස් මෙම විනාශයන් හමුවේ නොකඩවා ඒවා රැක ගැනීමටත්, නව නීති රීති සම්පාදනය කිරීමටත් ජලාශ්‍රිත පුරාවිද්‍යාව විෂයයක් වශයෙන් දියුණු කිරීමටත් අඛණ්ඩව කැපවිය.

පසුගිය දශක කිහිපය තුළදී පුරාවිද්‍යාවේ සිදුවන වර්ධනයත්, විවිධ විද්‍යා විෂයයන්ගේ අනුප්‍රාප්තියත් සමගම ජලාශ්‍රිත පුරාවිද්‍යාවද නෛතිකව ඉදිරියට ඇදෙන්නට විය. විශේෂයෙන්ම ගොඩබිමදී භාවිතා වන පුරාවිද්‍යා ක්‍රමවේදයන්ම ජලය තුළදී ක්‍රියාත්මක කිරිම සදහා නව තාක්ෂණය යොදාගැනීමට හා එය වෙනම විෂයයක් ලෙස දියුණුකිරීමට ගන්නා උත්සාහයන්ද මේ කාලය තුළ දක්නට ලැබේ. ජලයට ඔරොත්තු දෙන මිණුම් උපකරණ, කැණීම් හා සංරක්ෂණ ක්‍රම සොයා ගැණීමේ උත්සාහයේ සිට අනාගතය සඳහා පුරාණස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ප්‍රඥප්තීන් සකස් කිරීම දක්වා විෂයයාත්මක, විද්‍යානුකූල මාවතක වර්තමානයේදී මේ ක්ෂේත්‍රය ගමන් කරනු දක්නට ලැබේ. ක්‍රමයෙන් කෞතුකවස්තු එකතුකරන්නන් ගෙන් හා නිදන්හොරුන් ගෙන් වෙන්වී විද්‍යානුකූල පර්යේෂණ හා ගවේෂණ කිරීමක් දක්වා මේ ක්ෂේත්‍රය රැගෙන ඒමට පසුගිය දශක කිහිපය පුරාවට පුරාවිද්‍යාඥයින් දැක්වූ දායකත්වය විශිෂ්ට වේ. ජලාශ්‍රිත පුරාවිද්‍යාව ආශ්‍රිත තාක්ෂණය හා පර්යේෂණ කටයුතු බොහෝවිට සංවර්ධිත රටවල් ආශ්‍රිතව වර්ධනය විය. ආර්ථික අතින් ශක්තිමත් වීම මෙන්ම ජලය හා නාවුක කටයුතු අශ්‍රිතව විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම යන අංශ දෙකෙහිම දායකත්වය මීට හේතුවිය. ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු සදහා සෑමවිටම යොදා ගැනුනේ අනෙකුත් විද්‍යාත්මක පර්යේෂණ (සමුද්‍ර ගවේෂණ/තෙල් ගවේෂණ/ නාවුක කටයුතු) සඳහා යොදාගත් තාක්ෂණික මෙවලම්ය. පසුව ඒවා ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු සඳහා පරිවර්තනය කරගන්නා ලදී. මේ විෂයය සඳහාම නිපදවන ලද මෙවලම් ඇත්තේ ඉතා ස්වල්පයකි.

ඉහත සඳහන් කරුණු මත තාක්ෂණය, ආර්ථිකය හා ඉල්ලුම අතින්ද මූලික වූ යුරෝපීය රටවල් කේන්ද්‍ර කරගනිමින් ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු මෙන්ම කෞතුකවස්තු එක්රැස් කිරීමේ කටයුතු ද දෙයාකාරයකින් දියුණු විය. මේ කලාපයට අමතරව ඕස්ට්‍රේලියාවේ හා එක්සත් ජනපදායේ ද මේ ක්ෂේත්‍රයේ කටයුතු ආරම්භ විය.

යුරෝපයේ මෙන්ම ආසියානු පැසිපික් කලාපයට ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු ලඟාවීමට පෙරම නිදන් සොරුන් හා කෞතුකවස්තූන් එක් රැස් කරන්නන් ලඟා විය. යුරෝපීය රටවල් ජලාශ්‍රිත පුරාවිද්‍යා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගැනීමට ක්‍රියාත්මක වීමත් සමඟම අපහසුතාවයට පත්වන මෙම කණ්ඩායම් ලෝකයේ වෙනත් කලාප කරා ව්‍යාප්ත වන්නට විය. පසුගිය දශක හතරක පමණ කාලයක් තුළ මෙම ව්‍යාපාරයන් ලිහිල් හා දුර්වල නීතිරීති සහිත සහ ජලාශ්‍රිත පුරාවිද්‍යාවට ආගන්තුක රටවල් ආශ්‍රිතව විශාල වශයෙන් ක්‍රියාත්මක විය. 80 හා 90 දශකයන් ආශ්‍රිතව ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු ක්‍රම ක්‍රමයෙන් ලොව පුරා ව්‍යාප්තවීමත් සමගම මේ ප්‍රවනතාවයන් මඳක් අඩු වූ අතර, සමහර රටවල් තම දුර්වලතාවයන් වටහාගෙන නව නීතිරීති සම්පාදනය කරමින් ජලාශ්‍රිත සංස්කෘතික උරුමයන් රැක ගැනීමට කටයුතු කරති. මේ පිළිබඳව හතරවන පරිච්ඡේදයේ දී පුළුල්ව සාකච්ඡා කරනු ලැබේ.

පසුගිය දශක කිහිපය තුළ ජලාශ්‍රිත පුරාවිද්‍යාව ප්‍රධාන ප්‍රවාහයන් දෙකක් ඔස්සේ වර්ධනය වූ බව දක්නට ලැබේ. ඉන් එකක් වන්නේ මේ විෂයය ක්ෂේත්‍රය න්‍යායාත්මක හා ප්‍රායෝගිකව වර්ධනය වීමයි. ඊට අදාල මතවාද, විධික්‍රමයන් හා තාක්ෂණික ක්‍රමයන් ලොව විවිධ සම්ප්‍රදායන් හා සංස්කෘතීන් ඇසුරේ වැඩි දියුණු විය. විද්‍යානුකූලව ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු කිරීම, නව විද්‍යාවේ උපකාරය හා දියුණු සංරක්ෂණ ක්‍රම භාවිතය මේ අතර ප්‍රධාන වේ. දෙවන ප්‍රවාහය වන්නේ ජලාශ්‍රිත සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම පිළිබඳව විවිධ රටවල අවධානය යොමු වීම හා නව නීති රීති සම්පාදනය වීමයි. විශේෂයෙන්ම UNESCO සංවිධානය හා ICUCH (International Scientific Committee for the Protection of the Underwater Cultural Heritage) සංවිධානය ආශ්‍රිතව ජලාශ්‍රිත සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමේ 2001 ප්‍රඥප්තිය සකස් වීම දැක්විය හැක. ජලාශ්‍රිත පුරාක්ෂේත්‍ර කටයුතු වලට අමතරව මෙම උරුමයන් ආරක්ෂා කිරීම, මතුපරපුර සඳහා ඉතිරි කිරීම, දියුණු සංරක්ෂණ ක්‍රම භාවිතය, පුරාක්ෂේත්‍ර කළමනාකරණය හා මානව සම්පත් සංවර්ධනය කිරීම වැනි අංශයන් නව මතවාදයන් සමඟ දියුණු විය. ලොව පුරා රටවල් ගණනාවක් උරුමයන් ආරක්ෂා කිරීම හා කළමනාකරණය පිළිබඳව මතයන් දරමින් නිදන් හොරුන්ට හා කෞතුකවස්තූන් එක්රැස් කරන්නන් හා ව්‍යාපාර කරන්නන් හට එරෙහිව ක්‍රියාත්මක වනු දැකිය හැක.

## <u>ජලාශ්‍රිත පුරාවිද්‍යාව - ශ්‍රී ලාංකීය ප්‍රවේශය</u>

**1960 දශකය** - ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු සඳහා ප්‍රධාන ප්‍රවේශය ලෙස 1960 දශකයේ මුල් කාලවකවානුව තුළ දකුණේ මහාරාවණා පරය (Great Basses Reef) අසල ගිලී ගොස් තිබූ රිදී කාසි නැවේ සොයා ගැනීමයි. විනෝදය හා කෞතුකවස්තු එක් රැස් කිරීම සඳහා සාගරය හා කොරල් පර ගවේෂණය කල රොඩ්නි ජොන්ක්ලාස්, මයික් විල්සන් හා ශ්‍රීමත් ආතර් සී.ක්ලාක් (Rodney Jonklaas, Mike Wilson and Sir Arthur C. Clarke) යන කණ්ඩායමට ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ පිහිටි සුරත් හි නිපදවන ලද රිදී කාසි සහිතව බටහිර ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යය වෙත ගමන් කරමින් තිබියදී ගිලීගිය මෙම නෞකාව හමුවිය. ඊට සමකාලීනව මෙම නැවෙ හා ඒ අවට පරිසරය පාදක කරගනිමින් 'රන්මුතු දූව' නම් සිංහල චිත්‍රපටය ද නිර්මාණය කරන ලදී. (Devendra 2006, p.35) මේ කාසි වැඩි ප්‍රමාණයක් මෙම ස්ථානය සොයාගත් පිරිස විසින් ගොඩගෙන අයත් කර ගෙන තිබිණි. කිමිඳුම් උපකරණ ඉතා විරළ වූ එකල තාක්ෂණය පිළිබඳව මනා අවබෝධයක් ඇතිව සිටි හා ධනවත් මෙවැනි යුරෝපීය ජාතිකයින් ශ්‍රී ලංකාව වටා මුහුදේ රිසි සේ හැසුරුණු බව ඔවුන් විසින් රචනා කරන ලද වාර්තා කියවීමෙන් අවබෝධ වේ. ටොන් 05 පමණ බරැති මුහුදු පත්ලේ විසිරී තිබූ මෙම කාසි පිළිබඳ ප්‍රවෘත්තිය ලද ජනප්‍රියත්වය නිසාම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රකට ජලාශ්‍රිත පුරාවිද්‍යාඥයෙකු වූ පීටර් ත්‍රොක්මෝන් (Peater Throckmorton) මහතාට මහාරාවණා පරය ආශ්‍රිත ගවේෂණයක් සිදු කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරාධනා කර ඇත.(Devendra 2006, p.35) 1963 දී සිදුකළ මෙම ගවේෂණයේදී භූගෝලීය හා සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම, අවශ්‍ය දත්ත හා මිණුම් ලබා ගැනීම,පුරාවස්තු එක්රැස් කිරීම, කුඩා පර්යේෂණ කැණීමක් සිදු කිරීම වැනි දේ සිදුවිය. (Godakumbura 1977, p.77-78)මේ ගවේෂණයෙන් පසු ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු වල සැලකිය යුතු ක්‍රියාකාරකමක් වසර

ගණනාවක් යනතුරු සිදු නොවීය. විටින් විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ ක්ෂේත්‍රය දියුණු කිරීම පිළිබඳව සාකච්ඡා සිදු කළත් ඉන් ඉදිරියට යාමක් සිදු වී නොමැත.(Devendra 2006, p.35)

**1980 දශකය -** 1963 සිදු වූ ගවේෂණය, විශේෂයෙන්ම ආතර් සී ක්ලාර්ක් මහතා විසින් මහාරාවණා පරය ආශ්‍රිතව ලියන ලද වාර්තා හා පොත්පත්, රන්මුතු දූව චිත්‍රපටය වැනි හේතූන් නිසා මුහුදේ සැඟවී ඇති වස්තු සම්භාරයන් පිළිබඳව විවිධ පිරිස්වල අවධානය යොමුවන්නට විය. එම ස්ථාන හා වටිනා වස්තූන් සොයා කිමිදෙන පිරිස් ක්‍රමයෙන් වර්ධනය විය. ඒ සඳහා බලපවත්වන නීති පද්ධතියක් නොමැති වීම කරන කොට විශේෂයෙන්ම විදේශීය කිමිදුම් කරුවන් කෞතුකවස්තු සොයා මෙරට වෙරළ තීරය පුරා සැරිසරන්නට විය. මෙම සිදුවීම් වලට පිළිතුරක් වශයෙන් 1982 පිහිටුවනු ලැබූ නාරා ආයතනය (NARA - National Aquatic Resource Agency) මගින් ලංකාවේ සාගරික සම්පත් හා ඒවායේ නීතිමය අයිතිය පිළිබඳව නීති සම්පාදනය කරන ලදී. ජලාශ්‍රිත පුරාස්ථාන ද සාගර සම්පත් යටතේ මෙයට ඇතුල් කිරීමට තරම් එම ආයතනය නම්‍යශීලී විය (Devendra 2006, p.36) මේ කටයුතු සමගම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාරා ආයතනය හා වෙළඳ හා නාවික අමාත්‍යාංශය එක්ව සමුද්‍ර පුරාවිද්‍යාව පිළිබඳව ප්‍රථම වැඩ මුළුව 1984 දි පවත්වන ලදී (First National Workshop on Maritime History and Marien Archaeology).

නැවතත් 1986 දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පැවැත් වූ පළමුවන ජාතික පුරාවිද්‍යා සමුළුව සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පී.යූ. වීරවර්ධන මහතා ශ්‍රී ලංකාවේ සමුද්‍ර ඉතිහාසයට හා පුරාවිද්‍යාව න්‍යායික රාමුවක් (Theoratical Framework for Marien Archaeolog and Maritime History of Sri Lanka) නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එයින් ඇති වූ උනන්දුව මත එවකට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධානියා වූ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා කිමිදුම් ක්ෂේත්‍රයට සම්බන්ධ පිරිස් හා පුරාවිද්‍යාවට උනන්දු වූ පිරිස් නිළ නොවන මට්ටමින් එක්රැස් කර මේ ක්ෂේත්‍රය සඳහා ඉදිරි වැඩි පිළිවෙලක් සකස් කරන ලදී. එයට සම්බන්ධ වූ පිරිස් අතර පසුකාලීනව ජලාශ්‍රිත පුරාවිද්‍යා කටයුතු වලට මහත් දායකත්වය සැපයූ ශ්‍රී ලංකා සබ්ඇක්වා සමාජය (SLSAC-Sri Lanka Sub Aqua Club) හා සාමුද්‍රික උරුම අරමුදල (MHT-Maritime Heritage Trust) නැමැති ආයතන දෙකද විය. මේ එකමුතුවද අරමුදල් මදවීම නිසා අඩාල විය. එහෙත් 1988 දී ශ්‍රී ලංකාවේ සාමුද්‍රිත උරුමය (Maritime Heritage of Sri Lanka) නමින් එක් දින සමුළුවක් සංවිධානය කිරීමට ඔවුනට හැකිවිය. ඉහත සඳහන් ආයතන දෙක විටින් විට ගාලු වරාය ආශ්‍රිත ගිළුණු නැව් පිළිබඳව හා ශ්‍රී ලංකාවේ ජලජ යාත්‍රා පිළිබඳව ද කල අධ්‍යයනයන් ඉතා වැදගත් වේ.(Devendra 2006, p.37)

**1990 දශකය - ගාලු වරාය ව්‍යාපෘතිය -** 1990 පුරාවිද්‍යා ශත සංවත්සර සමුළුවේ දී ජලාශ්‍රිත පුරාවිද්‍යා අංශයක් පිහිටුවීම පිළිබඳව අදහස නැවතත් ඉදිරිපත් විය. මේ සමුළුවට සහභාගි වූ මහාචාර්ය කෙනත් මැක්ෆර්ත් (Professor Keneth MaCfurth) මහතා බටහිර ඕස්ට්‍රේලියානු සාමුද්‍රික කෞතුකාගාරයේ සහයෝගය හා සහභාගීත්වය ලංකාවට ලබාදීමට ඇති හැකියාව පිළිබඳව දැනුම් දීමක් සිදු කරන ලදී. එය මීට පෙර පැවැත් වූ ඉන්දියානු සාගරයේ අධ්‍යයනයන් පිළිබඳ සමුළුවේදී මේ පිළිබඳව ඇති වූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් විය.(ISIOS II – International Seminar on Indian Ocean Studies 1984) මේ අනුව බටහිර ඕස්ට්‍රේලියානු සමුද්‍රික කෞතුකාගාරයේ සහයෝගය ඇතිව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එක්ව ගාලු වරාය ආශ්‍රිතව පුරාවිද්‍යා ගවේෂණයක් සිදු කිරීමට පියවර ගන්නා ලදී. (Green, Devendra 1993: p.01) මේ කටයුත්තේ දී සාමුද්‍රික පුරාවිද්‍යා අරමුදල (MHT) සහ සබ්ඇක්වා සමාජය (SLSAC) විශාල සහයෝගයක් ලබා දී ඇත.

මෙයට සමාන්තරව ගාලු වරාය සංවර්ධනය කිරීමට පියවර ගැනීම තවත් විශේෂිත ක්‍රියාවලියක් විය. එයට හේතුව වූයේ සංවර්ධන කටයුත්තට පෙර එම ප්‍රදේශය පුරාවිද්‍යාත්මක ගවේෂණයට ලක්කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමයි. එම අවශ්‍යතාවය ද පෙර දැරි කරගෙන මුලින් සඳහන් කල සංවිධානයන් ගේ එකමුතුවෙන් ආරම්භ කෙරුණු වැඩ පිළිවෙල 1992 සිට ක්‍රියාත්මක කෙරින. මහාචාර්ය සේනක බණ්ඩාරණායකයන්ගේද, සාමුද්‍රික උරුම අරමුදලේ ලේකම් සෝමසිරි දේවේන්ද්‍ර මහතාගේද සම්බන්ධීකරණයෙන් මෙම වැඩ සටහන ක්‍රියාවට නැංවිණ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා මෙරට විශ්වවිද්‍යාල කිහිපයක් නියෝජනය කරමින් එවකට එම ආයතනයන්හි සේවය කල පුරාවිද්‍යා හා සංරක්ෂක පිරිස් ද,

විශේෂයෙන්ම විශ්ව විද්‍යාලයන්හි පුරාවිද්‍යා උපාධි අපේක්ෂකයින්ද පුහුණු කටයුතු සඳහා මේ ව්‍යාපෘතියට සම්බන්ධ විය. අනාගත පුහුණු කටයුතු සඳහා ජලාශ්‍රිත පුරාවිද්‍යාඥයින් හා සංරක්ෂක පිරිසක් බිහිකිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. ඒ සඳහා ප්‍රායෝගික ක්ෂේත්‍රය ලෙස ගාලු වරාය ආශ්‍රිත පුරාවිද්‍යා ගවේෂණ යොදා ගැනිණ. මෙහි මුල් අදියර 1992- 93 තෙක් ක්‍රියාත්මක විය. මහාචාර්ය ජෙරමි ග්‍රීන් (Professor Jeremy Green) මහතා මෙහි සම සම්බන්ධීකාරක වූ අතර, අවශ්‍ය උපදේශකයින් හා විශේෂඥයින් ඕස්ට්‍රේලියාවෙන් සහභාගි විය. කිමිදුම් කටයුතු සඳහා පුහුණු ලාංකික පුරාවිද්‍යාඥයින් නොසිටි හෙයින්, අවශ්‍ය කිමිදුම් පුහුණු කටයුතු හා තාක්ෂණික සහාය සඳහා සබ්ඇක්වා සමාජය (SLSAC) ඉදිරිපත් වී කටයුතු කරන ලදී. එමෙන්ම නිළ වශයෙන් සහභාගි නොවූවද ශ්‍රී ලංකා නාවික හමුදාවේ දක්ෂිණ කඳවුර මඟින් අවශ්‍ය බොහෝ උපකාර ලබාදෙන ලදී. (Devendra 2006, p.38)

තෝරාගත් පිරිස සඳහා අවශ්‍ය මූලික පුහුණුව හා දැනුම ලබාදෙන අතරම ක්‍ෂේත්‍ර වාර්තාකරණ කටයුතු සඳහාද යොදවා ගැනිණ. ලැබෙන පුරාවස්තු සංරක්ෂණය කිරීම මගින්ම නව සංරක්ෂකයින් හට පුහුණුව ලබාදීම සිදුකරන ලදී. ප්‍රදේශවාසීන්ගෙන් දැනගත් තොරතුරු මෙන්ම මීට පෙර කිහිපවිටක්ම කිමිදුම් කිරීමෙන් ලබාගෙන තිබූ දත්තද උපයොගී කර ගනිමින්ද, මුහුදු පත්ල නීරීක්ෂණය මඟින්ද පුරාක්ෂේත්‍ර ගවේෂණය සිදු වූ අතර, එහිදී හඳුනාගත් ස්ථාන 10ක් වැඩිදුර ගවේෂණය කරන ලදී. අවසන් අදියරේ දී ඉතා වැදගත් පුරාක්ෂේත්‍ර දෙකක් වූ 1661දී ගිලීගිය හර්කියුලිස් (Hercules) නෞකාව හා ,ඒ ක්‍ෂේත්‍රය (Site A) ලෙස හඳුනාගත් විශාල යකඩ නෞකාවද සොයා ගැනීමට ලැබිණ.

1993 වසර මුලදී පුහුණු හා ගවේෂණ වැඩ කටයුතු අතරම සහභාගී වූ උපාධි අපේක්ෂක පිරිසට කිමිදුම් පුහුණුව ලබාදෙන ලදී. (Devendra 2006, pg 39) මූලික පිහිනුම් අභ්‍යාස වල සිට ක්‍රම ක්‍රයෙන් කිමිදුම් උපකරණ භාවිතය දක්වා පුහුණුව ලබාදෙන ලදී. මේ කාලය තුලදී තවත් විශේෂිත සොයාගැනීමක් වූයේ එල් ක්‍ෂෙත්‍ර (Site L) ලෙස හැඳින් වූ 1659 ගිළුණු ඕලන්දයට අයත් ඇවොන්ඩ්ස්ටාර් (Avondster) නෞකාව සොයා ගැනීමයි. එසේම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ හදිසි කැඳවීමක් අනුව දින කිහිපයක ගවේෂණයක් සඳහා කිරින්ද මහාරාවණා පරය (Great Basses Reef) බලා යාමට සිදුවිය. මෙය 1963 පීටර් ත්‍රොක්මොන් මහතාගෙන් පසු එම ප්‍රදේශයේ නැවත පුරාවිද්‍යා ගවේෂණයක් සිදු වූ මුල් ම අවස්ථාව විය. එම ප්‍රදේශය නැවත පරීක්ෂා කල අතර, වාර්තාගත කිරීමද සිදුවිය. මතුපිටින් සොයාගත් රිදී කාසි 600 ක් පමණ රැගෙන ඒමට මෙම පිරිස සමත් විය. මේ වකවානුව තුළ නෙදර්ලන්ත ජාතික පර්යේෂක කණ්ඩායම්ද මේ ව්‍යාපෘතීන් වලට වැඩිවැඩියෙන් සම්බන්ධ වීම තවත් විශේෂිත සිදුවීමකි.

**1994-1995 කාලපරිච්ඡේදය -** මේ වසර 02 තුලදී විශේෂයෙන්ම මුල්‍යමය හේතූන් නිසා ගවේෂණ කටයුතු පවත්වාගෙන යාමට නොහැකි විය. එහෙත් පෙර ගවේෂණයන් ගේ ප්‍රකාශන කටයුතු සහ වාර්තා කටයුතු වල හැකි පමණින් නියුතු වීමට සිදුවිය. එමෙන්ම එවකට බලයට පත්වූ රජය වරාය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම නිසා ඉහත ගවේෂණ කටයුතු නැවත ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණ. එහෙත් මුල්‍යමය අර්බුදය ප්‍රබල විය. අවසානයේදී එවකට සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා වූ ලක්ෂ්මන් ජයකොඩි මහතා ගාලු වරාය ආශිත තත්ත්වය සලකා බලා වරාය සංවර්ධනය කිරීමට පෙර පුරාවිද්‍යා තත්ත්ව වාර්තාවක් හා ගවේෂණයක් සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඒ සඳහා අවශ්‍ය මුදල් ලබා දීමට ද කටයුතු සලස්වා දෙන ලදී. (Devendra 2006, p.39)

**1996-1998 කාලපරිච්ඡේදය -** අවශ්‍ය සැලසුම් හා මුල්‍ය පහසුකම් ලැබීම නිසා වඩා ක්‍රියාකාරී සාර්ථක වැඩ කොටසක් සිදු කිරීමට මේ කාලවකවානුව තුළදී හැකි විය. ජලාශ්‍රිත පුරාවිද්‍යා ක්‍ෂේත්‍රය සඳහා ස්ථාවර ආයතනයක් පිහිටුවීමේ සුදුසුම අවස්ථාව මෙය බව වැටහුණු බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ මෙය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකසන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල අවශ්‍ය සංරක්ෂණ රසායනාගාර පහසුකම් හා සංරක්ෂණ නිළධාරීන් පුහුණුව සඳහා සපයන ලදී. (Devendra 2006, p.39) නැවත නැවතත් නව කණ්ඩායම් පුහුණු කිරීමේ අපහසුතාවය වටහාගත් උපදේශකයින් මුලින් කිමිදුම් පුහුණුව ලැබූ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හරහා සම්බන්ධව සිටි පුරාවිද්‍යා කණ්ඩායම නැවත කැඳවීමට ගත් තීරණය ඉතා වැදගත් වේ. එසේ නොවිණි නම් මෙම කටයුතු නැවත අසාර්ථකවීමට ඉඩකඩ තිබිණ. එවකට පුරාවිද්‍යා උපාධි අපේක්ෂකයින් වූ බොහෝ පිරිස් මේ වනවිට පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ රැකියා වල නියුතු විය. ඔවුන් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේම රැඳී සිටීම ඔවුන්ගෙන් වැඩි පිරිසක් නැවතත් කැඳවාගැනීමේ කටයුතු සාර්ථකවීමට හේතු විය. ඔවුන් හට කඩිනමින් අන්තර්ජාතික PADI (Professional Association of Diving Instructors) කිමිදුම් බලපත්‍ර ලබා දීම මේ කාලයේදී සිදු විය. සමුද්‍රික උරුම අරමුදල සහ සබ්ඇක්වා ක්‍රීඩා සමාජය පෙර පරිදිම සම්බන්ධීකරණ කටයුතු කල අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මූලිකත්වය මත

පුරාවස්තු ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලදී. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව ද ශ්‍රී ලංකා නාවික හමුදාව ද අවශ්‍ය පරිදි සහයෝගය ලබා දෙන ලදී.

සයිඩ් ස්කෑන් සෝනාර් (Side Scan Sonar) යන්ත්‍ර මගින් ගාලු වරාය ගවේෂණය හා වාර්තාකරණය, පුරා වස්තු ගොඩගැනීම, සංරක්ෂණය, වාර්තා සැකසීම, ප්‍රකාශනය, ගාල්ලේ සමුද්‍රික කෞතුකාගාරය දියුණු කිරීම වැනි අංශයන් යටතේ මේ කාලවකවානුව තුළ පර්යේෂණ කටයුතු සිදුවිය. මූලික පුරාවිද්‍යා ක්ෂේත්‍ර කටයුතු වල සිට නවීණ විද්‍යාව හා තාක්ෂණය භාවිතයෙන් කල පර්යේෂණ දක්වා විවිධ විෂයයන්හි ප්‍රායෝගිකව නියැලීමට පුහුණු කණ්ඩායමට හැකි විය. ගවේෂණ ආශ්‍රිතව මතුවන විවිධාකාර පුරාවස්තු හේතුවෙන් ඒවායේ අයිතිය හා ආරක්ෂාව යන කරුණු කෙරෙහිද, ජලාශ්‍රිත පුරාවිද්‍යාවට අදාල නීති සම්පාදනය කෙරෙහිද අදාළ ආයතනයන්හි අවධානය යොමු වීම විශේෂ කරුණකි. ඒ ආශ්‍රිතව කෙරුණු කටයුතු නිසා 1998 පුරාවිද්‍යා ආඥා පණතට ජලාශ්‍රිත පුරාවිද්‍යා උරුමයන් රැකගැනීම පිළිබඳව ඇතුලත් කිරීමට ලැබීම විශේෂිත වේ. (Devendra 2006, p.41) 1998 වසර තුලදී විශේෂයෙන්ම පුහුණු කටයුතුවලට අමතරව මිණුම් ගැනීමේ හා පුරාවස්තු මුදා ගැනීමේ කටයුතු සිදු කරන ලදී. භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS – Geographical Information System) ක්‍රමය අනුව ගාලු වරාය තුළ ඇති පුරාක්ෂේත්‍ර වාර්තා ගත කිරීම අවශ්‍ය දත්ත රැස් කිරීම මේ අතර ප්‍රධාන වේ. සම්පූර්ණ ගාලු වරාය හා මුහුදු පතුල මේ කාලය තුළ වාර්තා ගත කරන ලදී. සයිඩ් ස්කෑන් සෝනාර් යන්ත්‍රය හා මැග්නටෝමීටර් (Magneto-meter)යන උපකරණ මගින්ද දත්ත එක්රැස් කරන ලදී. මේ යටතේ රේඛීය වශයෙන් කිලෝ මීටර 312 ක් ද, වර්ග මීටර 62 400 000 ප්‍රමාණයක්ද ගවේෂණයට ලක්කරන ලද අතර ගාලු වරාය තුළ පිහිටි පුරා ක්ෂේත්‍ර 25 ක් හඳුනාගනු ලැබ ඒවායේ දත්ත හැකිතාක් දුරට එක්රැස් කරගන්නා ලදී. පැරණි ලී රුවල් නැව් හා යටත් විජිත යුගයට පෙර භාවිතා වූ ගල් නැංගුරම් මේ සොයා ගැනීම් අතර විශේෂිත වේ.

මේ කාල පරාසය තුළදී ව්‍යාපෘතිය ඕස්ට්‍රේලියානු හා නෙදර්ලන්ත යන රටවල් දෙකේම සහසම්බන්ධයෙන් පවත්වාගෙන යන ලදී. ඒතුළින් ඇතිවූ තවත් වාසියක් වූයේ ඕලන්ද නැගෙනහිර ඉන්දියානු වෙළඳ සමාගමට (VOC) අයත් පැරණි ලේඛණ අධ්‍යයනය කිරීම සඳහා පෙළඹීමයි. ජාතික ලේඛණාරක්ෂක දෙපාර්මේන්තුව හා නෙදර්ලන්තයේ ඇම්සටර්ඩෑම් කෞතුකාගාරය ප්‍රධානව කෙරුණු අධ්‍යයන තුලින් නිශ්චිතවම ගාලු වරාය තුළ ගිලී ගිය Geinwens (1777) / Dolfjin (1663) / Babesteija(1735) / Hercules(1661) / Avondster(1659) නැමැති නැව් 05 ක් පිළිබඳව ඓතිහාසික තොරතුරු සොයාගන්නා ලදී. 1998 වසර අග හා 1999 මුල් මාසය මේ ගාලු වරාය ආශ්‍රිත ප්‍රායෝගික පුරාවිද්‍යා කටයුතු වල අවසානය සටහන් කෙරිණ. අනාගතය සඳහා පුහුණු කෙරුණු පුරාවිද්‍යා හා සංරක්ෂණ කණ්ඩායම තමන්ගේ රැකියා ස්ථාන කරා විසිරගිය අතර අවසාන දත්ත, සැලසුම් හා වාර්තා කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආශ්‍රිතව සිදුවිය.

**2001 ඇවොන්ඩ්ස්ටාර් ව්‍යාපෘතිය** - ගාලු වරාය ව්‍යාපෘතියේදී හමුවූ පුරාක්ෂේත්‍ර අතරින් 1659 දී ගිළි ගිය ඇවොන්ඩ්ස්ටාර් නම් රුවල් නෞකාව විශේෂිත වේ. ගාලු වරාය තුළ වෙරළාසන්නයේ රොත් මඩින් වැසී, ඉතා හොඳින් සංරක්ෂණ වී තිබූ මේ ගිලිනු නැවේ පර්යේෂණ කටයුතු විටින් විට 1998 වනතුරු සිදු විය. ඒ ආශ්‍රිත පැරණි ලියකියවිලි හමුවීම හා නැව නිශ්චිතව හඳුනාගැනීම නිසා එහි ඓතිහාසික වැදගත්කම කෙරේ නෙදර්ලන්ත රජයේ අවධානය යොමු විය. ඔවුන් ඉහත නැවේ පර්යේෂණ කටයුතු කිරීමට ආධාර ලබාදීමට කැමැත්ත පළකළ අතර මේ වනවිට නැවතී තිබූ සමුද්‍ර පුරාවිද්‍යා පර්යේෂණ හා පුහුණු කටයුතු නැවත ආරම්භ කිරීමට මෙය ඉතා හොඳ අවස්ථාවක් විය. ඒ අනුව 2000-2001 කාලයතුළදී මේ සඳහා අවශ්‍ය සැලසුම් හා යෝජනා සැකසුන අතර 2000 වසරේදී ආරම්භ කරන ලද උරුම සහයෝගිතා පදනම (Mutual Heritage Center) මගින් මේ සඳහා අවශ්‍ය මැදිහත්වීම කරන ලදී. නෙදර්ලන්ත සංස්කෘතික අරමුදල අවශ්‍ය මූල්‍ය ආධාර ලබාදුන් අතර ගාල්ල පැරණි ජැටිය ආශ්‍රිතව ඇති රසායනාගාරය කේන්ද්‍ර කරගනිමින් මුහුදු පුරාවිද්‍යා ඒකකය ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. (Parthesius, Millar 2003, p.05) විදේශීය ආධාර මත විශේෂ ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණය කිරීමේ පහසුව සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ගාල්ල පැරණි වරායේ ජැටිය වූ රසායනාගාරය හා උපකරණ මධ්‍යම සංස්කෘතික අරමුදලට පවරාදෙන ලදී. ඒ අනුව 2001 වසර අවසානයේ සිට 2005 දක්වා ඇවොන්ඩ්ස්ටාර් ව්‍යාපෘතිය මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක විය.

<u>ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු</u>

01. මුහුදු පුරාවිද්‍යා ඒකකයක් හා සංරක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම හා ඊට අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීම සඳහා යටිතල පහසුකම් සැකසීම.

02. කැණීම් හා ස්ථානීය සංරක්ෂණ (In-Situ Conservation) ක්‍රම මඟින් ඇවොන්ස්ටාර් පුරාක්ෂේත්‍රය වැඩිදුර අධ්‍යයනය කිරීම හා ආරක්ෂා කිරීම.
03. ගාලු වරායේ ගිලුණු (VOC) නැව් පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම.
04. ගාලු වරාය ආශ්‍රිත කලාපයේ වූ ඓතිහාසික වැදගත්කම අධ්‍යයනය සඳහා අවශ්‍ය වැඩසටහන් සංවර්ධනය කිරීම.
05. සමුද්‍රික පුරාවිද්‍යා කෞතුකාගාරයක් පිහිටුවීම හා මේ විෂයය කෙරෙහි මහජන අවධානය යොමු කිරීම.
06. ජලාශ්‍රිත පුරාක්ෂේත්‍ර රැකගැනීම සඳහා අවශ්‍ය ක්‍රම සම්පාදනය සහ ආසියාතික කලාපය තුළ එම ක්‍රියාදාමයට සම්බන්ධ ආකෘතියක් ලෙස මුහුදු පුරාවිද්‍යා ඒකකය ක්‍රියාත්මක කිරීම.

මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූ ඇවොන්ස්ටාර් පුරා ක්ෂේත්‍රය කැණීම හා අධ්‍යයන කටයුතු උපයෝගී කරගෙන එමගින් ශ්‍රී ලාංකීය පුරාවිද්‍යා හා සංරක්ෂණ නිළධාරීන් පුහුණු කිරීමේ කටයුතු 2001 නොවැම්බර් මස සිට ආරම්භ කරන ලදී. ගාලු වරාය ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලැබූ නිළධාරීන් නැවත කැඳවන ලදී. ඒ අනුව එම පිරිසෙන් 60% ක පමණ පිරිසක් නැවත කැඳවා ගැනීමට හැකිවිය. ගාලු වරාය ව්‍යාපෘතිය මෙන් නොව මෙම ව්‍යාපෘතියේදී අවුරුද්ද පුරාම පර්යේෂණ කටයුතු සිදුකල යුතු වූ අතර ව්‍යාපෘතියෙන් පසුව ස්වාධීනව ක්‍රියාත්මක වීමට නියමිත මුහුදු පුරාවිද්‍යා ඒකකය සමඟ ද රැඳී සිටිය යුතු විය. ස්ථිර වශයෙන්ම තම සේවාස්ථානය ගාල්ල කරගැනීමට කැමති වූ පිරිස පමණක් ව්‍යාපෘතිය සඳහා රඳවාගන්නා ලදී. ඒ අනුව පෙර පුහුණුව ලද පුරාවිද්‍යාඥයින් 06 දෙනෙකු හා සංරක්ෂකයින් 06 දෙනෙකු මේ සඳහා සම්බන්ධ කරගන්නා ලදී. මීට අමතරව දිය යට ඡායාරූපකරණය හා පුරාවස්තු ලේඛණගත කිරීම සඳහා පුහුණුවීමට නවක පුරාවිද්‍යාඥයින් දෙදෙනෙකු බඳවාගන්නා ලදී. 14 දෙනෙකුගෙන් යුක්ත වූ මෙම ආරම්භක කණ්ඩායම සමග නෙදර්ලන්ත හා ඕස්ට්‍රේලියානු විද්‍යාඥයින් ඇවොන්ඩ්ස්ටාර් ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලදී. (Parthesius, Millar 2003, p.05)

මෙම කණ්ඩායම උණවටුන නුයිට් ගෙඩාච් (Nooit Gedatch) නම් හෝටලයේ නවාතැන් පහසුකම් ලබාදුන් අතර ඒ වනවිට පැරණි ගාලු වරායේ එක් ජැටියක් මත සම්පූර්ණයෙන් අළුත්වැඩියා කරන ලද රසායනාගාර ගොඩනැගිල්ලේ සිට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලදී. නව ගොඩනැගිල්ලේ එක් කොටසක් පරිඝණක හා පරිපාලන ප්‍රදේශය ලෙසින් ද මැද කොටස සංරක්ෂණ රසායානාගාරය ලෙස ද, මුහුදට ආසන්න කොටස කිමිදුම් ඒකකය ලෙසින්ද භාවිතයට සැලසුම් කරන ලදී. අවශ්‍ය උපකරණ හා යාන්ත්‍රික කොටස් අළුතින් මිලදීගත් අතර කිමිදුම් කටයුතු කඩිනමින් ආරම්භ කරන ලදී. 2002 වසරේ සිට ජනවාරි - මාර්තු තෙමසත් නොවැම්බර් - දෙසැම්බර් යන දෙමසත් කිමිදුම් කටයුතු සඳහා යොදාගත් අතර විදේශ පුරාවිද්‍යා හා සංරක්ෂණ කණ්ඩායම රැඳී සිටියේ මෙම කාලය තුළදීය. අප්‍රේල් සිට නොවැම්බර් දක්වාවූ මෝසම් වැසිසමය තුළ බොහෝ විට දේශීය කණ්ඩායම සංරක්ෂණ හා වාර්තා කටයුතු පවත්වාගෙන යන ලදී. පුරාක්ෂේත්‍රය කොටස් 03 කට බෙදා ප්‍රධාන කැණීම් 03 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරතුර පුරාක්ෂේත්‍රයේ සැලසුම (Site Plan) ඇඳීම සඳහා අවශ්‍ය මිණුම් ගැනීමේ කටයුතු නොකඩවා පවත්වාගෙන යන ලදී. කැණීම් හා ගවේෂණ මඟින් ගොඩගත් පුරා වස්තු සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව මෙම පිරිසට ලබා දෙන ලදී. වසර 03 අවසන් වන විට මෙම කැණීම් කටයුතු හා අධ්‍යයන කටයුතු බොහෝ දුරට සාර්ථකව සිදුකරන ලදී. 2003 වසරේ හොංකොන් නුවර පැවැත්වූ අන්තර්ජාතික සමුද්‍ර පුරාවිද්‍යා සම්මේලනය (UNESCO 2001 Convention for protection of the Underwater Cultural Heritage) සඳහා මෙරට නියෝජනය කරමින් සහභාගි වූ නියෝජිතයින් ඇවොන්ඩ්ස්ටාර් ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. එහිදී UNESCO පුහුණු පාසල (ආසියානු පැසිපික් කලාපය සඳහා සමුද්‍ර පුරාවිද්‍යා පුහුණු පාසලක් ආරම්භ කිරීම) සම්බන්ධයෙන් වූ යෝජනාවට ශ්‍රී ලංකාව ප්‍රතිචාර දක්වූ අතර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට ද එකඟ විය. 2003 වසර අවසානයේ (ICUCH – International Committee for Protection of Underwater Cultural Heritage) සංවිධානයේ වාර්ෂික සමුළුව ලංකාවේ මුහුදු පුරාවිද්‍යා ඒකකය ආශිතව පැවැත් විය.

කෙසේ වෙතත් නොයෙකුත් ආයතනික ප්‍රශ්න හා පෞද්ගලික ප්‍රශ්න හමුවේ දේශීය සාමාජිකයින් කිහිපදෙනෙකුම මුහුදු පුරාවිද්‍යා ඒකකය අත්හැර යන ලදී. 2004 වසර මැද වනවිට සංරක්ෂකයින් තිදෙනෙකු හා පුරාවිද්‍යාඥයින් තිදෙනෙකු කණ්ඩායම හැර ගිය අතර ඉතිරි සාමාජිකයින් 08 දෙනා ගවේෂණ කටයුතු සිදුකරගෙන යන ලදී. 2004 වසර අවසානය වනවිට කැණීම් කටයුතු බොහෝ දුරට අවසන්ව පැවති අතර පුරාක්ෂේත්‍රයේ කොටසක් කෘතිම ප්ලාස්ටික් දැලක් මාර්ගයෙන් වසා ස්ථානීය සංරක්ෂණයක් සිදුකරන ලදී. 2004 දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනය වනවිට නත්තල් නිවාඩුව සඳහා

විදේශීය කණ්ඩායමේ සියළුදෙන මෙරටින් බැහැරව සිටි අතර පෝය දිනයක් වූ හෙයින් දේශීය කණ්ඩායම ද ගාල්ලේ නොසිටියහ. පෙරදී සඳහන් කළ පරිදි දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනයෙන් ජැටිය මතවූ මුහුදු පුරාවිද්‍යා ඒකකයේ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් විනාශයට පත්වූ අතර කිමිදුම් හා සංරක්ෂණ උපකරණ, පරිගණක, පුස්තකාල ඇතුළු සියළු වාර්තා විනාශ වී ගොස් තිබිණ. වඩා ප්‍රබලම හානිය සිදුවූයේ පුරාවස්තූන් වලටය. 1992 වසරේ සිට ගවේෂණ හා කැණීම් මගින් ගොඩගන්නා ලද පුරාවස්තූන්ගෙන් විශාල ප්‍රමාණයක් මුහුදට ගසාගෙන ගොස් තිබිණි. වාසනාවකට ජීවිත හානි කිසිවක් සිදු නොවුණු අතර ඒ අවස්ථාවේ ඒකකයේ සිටි ආරක්ෂක නියාමකයා ඇතුළු සේවකයින් කිහිපදෙනෙකු ජීවිත ගලවා ගැනීමට සමත් වී තිබිණ. මාර්ග අවහිරතා ඉවත් කිරීමෙන් පසුව දින 02 කින් පර්යේෂණ කණ්ඩායමට නැවතත් පුරාවිද්‍යා ඒකකයට පැමිණීමට හැකි විය. ඉතිරි වී තිබුණු පුරාවස්තු හා අළුත්වාඩියා කළහැකිව තිබූ උපකරණ ආරක්ෂිත ස්ථානයකට රැගෙන ගිය අතර නැතිවූ පුරාවස්තු සෙවීමේ කටයුතු ආරම්භ කරන ලදී. මාස දෙකක් ඇතුළතදී පුරාවිද්‍යා ඒකකය හා සංරක්ෂණ රසායනාගාරය තාවකාලිකව නැවත ආරම්භ කිරීමට අවශ්‍ය ආධාර නෙදර්ලන්ත රජය ප්‍රධානව අනෙකුත් රටවලින් ලබා දෙන ලදී. පුහුණුව ලැබූ පුරාවිද්‍යා නිළධාරීන් හා සංරක්ෂණ නිළධාරීන් නිරුපද්‍රතව සිටීම නිසා මේ කාර්යය පහසු විය. මාස 03 ක් වැනි කෙටි කාලයක් තුළදී ගාල්ල කොටුව තුළ ඇති ගොඩනැගිල්ලක මුහුදු පුරාවිද්‍යා ඒකකයේ වැඩකටයුතු නැවත ආරම්භ කළ අතර 2005 මාර්තු 30 වන දින කිමිදුම් කටයුතු නැවත ආරම්භ කරන ලදී.

ගාලු වරාය ආශ්‍රිත පුරාක්ෂේත්‍රයන්හි ගවේෂණ හා කැණීම් කටයුතු නැවත සුළු වශයෙන් ආරම්භ කිරීමට හැකිවූ නමුත් මූලිකත්වය ලබාදෙන ලද්දේ විනාශ වූ හා නැවත ලුණු වතුරට මිශ්‍රවූ පුරාවස්තු සංරක්ෂණ කටයුතු, ලියාපදිංචි කිරීමේ කටයුතු හා නැවත පරිගණක දත්ත එක්රැස් කර වාර්තා කිරීමේ කටයුතුවලටය. 2006 වසර වන විටදී එම වැඩකටයුතු අවසන් කර නැවතත් සුපුරුදු පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. ඇවොන්ඩ්ස්ටාර් ව්‍යාපෘතියේ කටයුතු අවසන්ව තිබූ බැවින් මුහුදු පුරාවිද්‍යා ඒකකයේ කටයුතු ස්වාධීනව කරගෙන යාමට පරිසරයක් උදාවිය. මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ සියළුම පරිපාලන කටයුතු සිදුවූ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක්ද ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබිණ. Site A හා E නමින් හැඳින්වූ ක්ෂේත්‍ර දෙකේ පර්යේක්ෂණ කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර තිබූ අතර මෙම වසර තුළදී UNISCO පුහුණු පාසල ආරම්භ කිරීමේ මූලික අදියර වූ ගාල්ල පුරාවිද්‍යා ඒකකයේ නිලධාරීන් සඳහා වැඩිදුර පුහුණුවක් ලබාදීමේ කටයුතු ආරම්භ විය. 2006 මාර්තු - අප්‍රේල් කාලය තුළදී ක්‍රියාත්මක වූ මෙම පුහුණු පාසලේ මුල් අදියර පුහුණු කරුවන් පුහුණු කිරීම "Training the Trainers" ලෙස නම්කල අතර ඒ සඳහා චීනය නියෝජනය කරමින් පුරාවිද්‍යා නිලධාරියෙක්ද සහභාගීවිය.

2007 වසරේදී ද ක්ෂේත්‍ර කටයුතු වලට අමතරව උරුම කළමනාකරණය සඳහා වූ ආසියානු අධ්‍යයන ආයතනය (AAHM – Asia Academy for Heritage Management) විසින් පැවැත්වූ ජලාශ්‍රිත පුරාවිද්‍යා උරුම කළමනාකරණ වැඩසටහන ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකයද ආශ්‍රය කරගෙන පවත්වන ලදී. ඒ සඳහා ජාත්‍යාන්තර විශේෂඥයින් හා ප්‍රවීනයන් බොහෝ දෙනෙකු සහභාගීවිය. එයට සමාන්තරව ජලාශ්‍රිත පුරාවිද්‍යා උරුමයන් රැකගැනීම කළමනාකරණ සඳහා වූ 2001 ප්‍රඥාප්තිය සම්මත කිරීම සඳහා රටවල් උනන්දු කිරීමට කැඳවන ලද ජාත්‍යන්තර සමුළුව හික්කඩුවේදී පවත්වන ලදී. එහිදි ක්ෂේත්‍රයේ වර්තමාන කටයුතු පිළිබඳව පුළුල්ව විග්‍රහ කළ අතර UNESCO පුහුණු පාසලේ කටයුතු කඩිනම් කිරීමටද සාකච්ඡා කරන ලදී. 2007 වසරේ සිදුවූ තවත් වැදගත් සිදුවීමක් වූයේ මෙතෙක් ගාලු වරාය ආශ්‍රිතව පමණක් පර්යේෂණ කටයුතුවල නියුතුව සිටි කණ්ඩායම අම්බලන්ගොඩ හා හික්කඩුව ප්‍රදේශවල ගිළුණු නැව් කිහිපයක ගවේෂණ කටයුතු සිදුකිරීමය. 2008 වසරේ සිට UNESCO පුහුණු පාසලේ කටයුතුද අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී තිබූ අතර එයට අවශ්‍ය අධාරද UNESCO සංවිධානය වෙත ලැබී තිබිණ. මෙය ශ්‍රී ලංකාවේ මුහුදු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ඉතා වැදගත් පියවරක් වූ අතර, මේ ක්ෂේත්‍රය මෙරට තුළ ස්ථාපිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතු ශක්තිමත් කරගැනීමට උදාවූ අවස්ථාවක් ද විය.

**රසික මුතුකුමාරණ**
**මුහුදු පුරාවිද්‍යා ඒකකය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොටුව, ගාල්ල.**
Email: muthurasika@gmail.com
Tel: 0718100698